කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

# ප්‍රාසංගික කලා

## ඉන්දියාවේ සම්භාව්‍ය නර්තන සහ සංගීත සම්ප්‍රදා PART - E 3015

(පැරණි නිර්දේශය)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 15 යි. කාලය : පැය 03 යි.

---

### I කොටස

01. රාගවල විකාසනය පිළිබඳ කාලානුක්‍රමික විග්‍රහයක් කරන්න.

02. ගාන්ධර්ව හා මාර්ග සංගීතය පිළිබඳ විමර්ශනයක් කරන්න.

03. රාගවල ගානසමය නිර්ණය කිරීමේ සිද්ධාන්තය පහත දැක්වෙන කරුණු අනුව පැහැදිලි කරන්න.

    1. පූර්වාංගය සහ උත්තරාංගය
    2. අධ්ව දර්ශක ස්වරය

04. වෛදික ග්‍රන්ථවල අන්තර්ගත සංගීතමය කරුණු පිළිබඳ විමර්ශනයක් කරන්න.

05. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    1. වාදී - සංවාදී
    2. අවිර්භාව - තිරෝභාව
    3. කරාණා
    4. පරමේලප්‍රවේශක රාග

06. මෝගල් ආක්‍රමණ භාරතීය සංගීතය විෂයෙහි සිදුකළ බලපෑම පිළිබඳ නිදර්ශනාත්මකව විස්තර කරන්න.

07. අක්බාර් රාජ්‍ය සමයේ නිර්මාණය වන ධැපද් වානී පද්ධතිය පිළිබඳ විමර්ශනයක් කරන්න.

08. හින්දුස්ථානී සහ කර්ණාටක සංගීත පද්ධති අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ උදාහරණ සහිත විමර්ශනයක් කරන්න.

II කොටස

09. ඉන්දියාවේ සම්භාව්‍ය නර්තන කෙරෙහි හින්දු ආගමික බලපෑම ඔබ කැමති එක් නර්තන සම්ප්‍රදායක් නිදසුන් කරගනිමින් පැහැදිලි කරන්න.

10. භරත නාට්‍යම් හි රංග වින්‍යාස මඟින් නෘත්ත, නෘත්‍ය සහ නාට්‍යමය ගුණ ගම්‍යමාන වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

11. කථකලී නෘත්‍ය නාටක (Dance Drama) විශේෂයක් ලෙස සැලකෙන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

12. සම්භාව්‍ය කථක් නර්තනයකදී සතරවිධ අභිනය භාවිතවන ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

13. පහත සඳහන් මාතෘකා අතුරින් <u>දෙකක්</u> පිළිබඳ සටහන් සපයන්න.

අ. කූත්තම්බලම්
ආ. කලරි
ඉ. අරංගේත්‍රම්

14. සම්භාව්‍ය මනිපුරි නර්තනයක් සමකාලීන සමාජයේ පිළිබිඹුවක් යැයි සැලකෙනුයේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

15. මෝහිනී ආට්ටම්, කුචිපුඩි සහ ඔඩිසි අර්ධ සම්භාව්‍ය (Semi Classical) නර්තන සම්ප්‍රදා ලෙස සැලකීමට පසුබිම් වී ඇති හේතු කවරේදැයි පහදන්න.

***********************************